# 05 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය



## හැඳින්වීම

බ්‍රිතාන්‍යයන් 1815 වර්ෂයේ දී උඩරට රාජධානිය යටත් කර ගැනීමත් සමග එතෙක් මෙරට පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳ වැටුණි. එතැන් සිට 1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාව නිදහස දිනා ගන්නා තෙක් වසර 133ක කාලයක් බ්‍රිතාන්‍යයෝ මෙරට පාලනය කළහ.

ලාංකිකයන් නොකඩවා ගෙනගිය උද්ඝෝෂණ හේතුවෙන් වරින් වර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාදීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට සිදු විය. එම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලින් ස්වදේශිකයන්ට පැවරූ බලය පිළිබඳව සෑහීමකට පත් නොවූ ලාංකිකයෝ අඛණ්ඩව උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කළහ. 1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට යළි නිදහස දිනා ගත හැකි වූයේ එම උද්ඝෝෂණවල ප්‍රතිඵල වශයෙනි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට පැවති දේශපාලන උද්ඝෝෂණ සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ස්වරූපය ආදිය පිළිබඳව මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කෙරේ.

## 5.1 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ 1833

1815 වර්ෂයේ දී ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් කර ගැනීමත් සමග සමස්ත දිවයින ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් විය. එතැන් සිට බ්‍රිතාන්‍යයන් මෙරට පාලන කටයුතු ගෙන යාමේ දී උඩරට හා පහත රට ප්‍රදේශ වෙන් වෙන්ව පාලනය කිරීමත්, බ්‍රිතාන්‍යයෙන් පැමිණි නිලධාරින්ගේ වැටුප් හා පහසුකම් වෙනුවෙන් විශාල වැය බරක් දැරීමට සිදු වීමත්, ආදිය නිසා 1828 වර්ෂය පමණ වන විට රජයේ ආදායමට වඩා වැය පක්ෂය ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. මේ නිසා මෙරට ආණ්ඩුවේ වියදම් පියවා ගැනීමට බ්‍රිතාන්‍ය මව් ආණ්ඩුවේ මුදල් යෙදවිය යුතු තත්වයක් උද්ගතව තිබුණි. එහෙත් යටත් විජිතවල කටයුතු වෙනුවෙන් මව් ආණ්ඩුවේ මුදල් වැය කිරීම මේ වන විට බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය නොවී ය. එබැවින් ලංකාවට පැමිණ මෙරට ආදායම් හා වියදම් තත්වය සොයා බලා පාලන ක්‍රමයේ දුර්වලතා අධ්‍යයනය කොට අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම සඳහා යටත් විජිත භාර ලේකම්වරයා විසින් විශේෂ කොමිෂන් සභාවක් පත් කරන ලදි. ඩබ්. එම්. ජී. කෝල්බෲක් මහතාගේ නායකත්වයෙන් යුතුව පත් කෙරුණු එම කොමිසම කෝල්බෲක් කොමිසම ලෙස හැඳින්වේ. කෝල්බෲක් මහතාටආර්ථික හා පාලන කටයුතු සොයා බැලීමේ වගකීම පැවරුණි. මෙරට අධිකරණ කටයුතු පරීක්ෂා කොට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා චාල්ස් හේ කැමරන් නැමැත්තා පසුව පත් කෙරිණ.

### කෝල්බෲක් කොමිසමෙහි විමර්ශනයට ලක් වූ ක්ෂේත්‍ර

රජයේ ආදායම් මාර්ග හා වියදම් කටයුතු,- ඩබ්. එම්. ජී. කෝල්බෲක්

අධිකරණ ක්ෂේත්‍රය - චාල්ස් හේ කැමරන්

කෝල්බෲක් හා කැමරන් යන දෙදෙනා මෙරටට පැමිණ ලංකාවේ පාලන ක්‍රමය හා අධිකරණ ක්ෂේත්‍රය ගැන කරුණු පිරික්සා ඇතැම් ලාංකිකයන්ගේ ද අදහස් විමසා බලා තම නිර්දේශ ඇතුළත් යෝජනාවලියක් ඉදිරිපත් කළහ. 1833 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ එය කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ.

### කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන ලක්ෂණ

- ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
- උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම.
- පරිපාලන කටයුතු සඳහා මුළු රට පළාත් පහකට බෙදීම.
- අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
- ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම.

මීළඟට අපි ඉහත සඳහන් ලක්ෂණ එකින් එක ගෙන සංක්ෂිප්තව කරුණු විමසා බලමු.


## ❖ ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

කෝල්බෲක් කොමිසම මෙරටට පැමිණෙන විට ලංකාවේ ආණ්ඩුකාරවරයා වෙත ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල ඒකරාශී වී තිබුණි. මෙම තත්වය කෝල්බෲක්ගේ විමතියට හේතු වූ අතර ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීමේ අරමුණ ඇතිව හෙතෙම ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීමට යෝජනා කළේ ය.

### ව්‍යවස්ථාදායක සභාව

කෝල්බෲක් යෝජනා අනුව නීති සම්පාදනය සඳහා පිහිටුවන ලද ව්‍යවස්ථාදායක සභාව සාමාජිකයන් 15කින් යුක්ත විය. ඔවුන් නිල ලත් හා නිල නොලත් වශයෙන් කොටස් දෙකකට බෙදා තිබුණි. ඒ අනුව නිල ලත් සාමාජිකයන් සංඛ්‍යාව නවයක් වූ අතර ඔවුහු නිල බලයෙන් තේරී පත් වූ රජයේ උසස් නිලධාරීන් වූහ. නිල නොලත් සාමාජිකයන් හයක් සිටි අතර ඔවුන් ජන වාර්ගික පදනම යටතේ ආණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත් කරන ලදි. නිල නොලත් සාමාජිකයෝ යුරෝපීය නියෝජිතයන් තිදෙනෙකුගෙන් ද සිංහල, ද්‍රවිඩ, බර්ගර් යන එක් එක් ජන කොටස් වෙනුවෙන් තෝරාගත් නියෝජිතයන් තිදෙනෙකුගෙන් ද සමන්විත වූහ. ව්‍යවස්ථාදායක සභාවේ මුලසුන ආණ්ඩුකාරවරයාට හිමි විය. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් එක් එක් ජන වර්ග පදනම් කරගෙන ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් තෝරා ගැනීමට හඳුන්වා දුන් වාර්ගික නියෝජන ක්‍රමය පසු කාලයේ දී මෙරට ජන වර්ග අතර භේද ඇති වීමට හේතු වූයේ යැයි පිළිගැනේ.

**ව්‍යවස්ථාදායක සභාව 1833**



1833 වර්ෂයේ පිහිටු වූ ව්‍යවස්ථාදායක සභාව වරින් වර ප්‍රතිසංස්කරණයට ලක් වෙමින් ලාංකිකයන් අතට ලැබුණ බලතල ප්‍රමාණය වැඩි වී ඒ තුළින් අනාගතයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් කරා යාමට පදනම වැටුණි. මේ නිසා කෝල්බෘක් ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාව හඳුන්වාදීම මෙරට දේශපාලන ක්‍රමයෙහි වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය.

## විධායක සභාව

කෝල්බෘක් යෝජනාවලට අනුව පිහිටුවන ලද විධායක සභාව ආණ්ඩුකාරවරයා හා රජයේ මිනුම්පති වැනි රජයේ ඉහළ නිලධාරින් පිරිසකගෙන් සමන්විත විය. ආණ්ඩුකාරවරයා මෙහි මූලාසනය දැරී ය. රටේ සියලු පරිපාලන හා මූල්‍ය කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා මෙම සභාවේ අදහස් විමසීම අවශ්‍ය විය.

### ❖ උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වා දීම

1815 වර්ෂයේ දී බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය යටත් කර ගැනීමෙන් පසු උඩරට හා පහතරට ප්‍රදේශ වෙන් වෙන්ව පාලනය කිරීමේ ක්‍රමයක් අනුගමනය කළේ ය. මෙම ක්‍රමය රජයේ වියදම් ඉහළ යාමට හේතු වී ඇති බව පෙන්වා දෙමින් එම ප්‍රදේශ ඒකාබද්ධ කොට ඒකීය පාලන ක්‍රමයක් ඇති කිරීමට කෝල්බෘක් යෝජනා කළේ ය.

### ❖ පරිපාලන කටයුතු සඳහා මුළු රට ම පළාත් පහකට බෙදීම

1833 වර්ෂය තෙක් පරිපාලන කටයුතු සඳහා ලංකාව පළාත් 16කට බෙදා තිබුණි. මෙසේ පළාත් සංඛ්‍යාව වැඩි වීම නිසා නිලධාරීන් හා ඔවුන්ගේ පහසුකම් ආදියට විශාල මුදලක් දැරීමට සිදු වීමෙන් රජයේ වියදම් ඉහළ යන බව පෙන්වා දුන් කෝල්බෘක් වියදම් අඩු කිරීම පිණිස පරිපාලන ප්‍රදේශ පහකට බෙදා ඒ ඒ පළාත් සඳහා පාලන මධ්‍යස්ථාන පහක් පිහිටුවීමට යෝජනා කළේ ය. එම පළාත් භාරව කටයුතු කිරීමට රජයේ ඒජන්තවරයෙකු බැගින් පත් කිරීමට ද තීරණය කෙරිණ.

**කෝල්බෘක් යෝජනා කළ පළාත් හා ඒවායේ පාලන මධ්‍යස්ථාන**

| පළාත | පරිපාලන මධ්‍යස්ථාන |
|---|---|
| උතුරු පළාත | යාපනය |
| දකුණු පළාත | ගාල්ල |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය |
| බස්නාහිර පළාත | කොළඹ |
| මධ්‍යම පළාත | මහනුවර |



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

❖ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

රටේ සිටි වැඩිහිටි පිරිමි සියලු දෙනා ම අවුරුද්දට නියමිත දින ගණනක් රජයට නොමිලේ සේවා සැපයීම අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය ලෙස හැඳින්වේ. අතීතයේ දී රාජ්‍යයේ පොදු කටයුතු සඳහා රටවැසියන්ගේ ශ්‍රමය ලබා ගැනීමට මෙම රාජකාරී ක්‍රමය යොදා ගත්හ. ඔවුන් ජීවත් වූ ගම්මානවල වැව් අමුණු, ඇළවේලි, පාරවල් ප්‍රතිසංස්කරණය කිරීම වැනි පොදු කාර්යන් මේ යටතේ සිදු කෙරිණ. මුදල් ගෙවීමකින් තොරව ලබා ගත් මෙම සේවාව මිනිසුන්ගේ නිදහසට මෙන් ම දියුණුවට බාධාවක් බව පෙන්වූ කෝල්බෲක් එම ක්‍රමය අවලංගු කිරීමට නිර්දේශ කළේ ය.

❖ ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම

කෝල්බෲක් පැමිණි අවධිය වන විට ආණ්ඩුවේ වියදම් ඉහළ යාමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් වූයේ මෙරට පරිපාලන කටයුතුවලට අවශ්‍ය නිලධාරීන් යුරෝපයෙන් ගෙන්වීමයි. ඔවුන්ගේ වැටුප්, නවාතැන් පහසුකම් හා වෙනත් සේවා ලබා දීමට රජයට විශාල මුදලක් වැය විය. මේ නිසා රජයේ වියදම් අඩු කිරීමට නම් විදේශ නිලධාරීන් වෙනුවට දේශීය නිලධාරීන් යොදා ගත යුතු යැයි කෝල්බෲක් යෝජනා කළේ ය. ඒ සඳහා ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීමේ අවශ්‍යතාවක් මතුව තිබුණි. ස්වදේශිකයන් අතර සිටි මුදල් ගෙවා අධ්‍යාපනය ලබා ගත හැකි පිරිසට ඉංග්‍රීසි මාධ්‍යයෙන් හොඳ අධ්‍යාපනයක් ලබා දීමෙන් ආණ්ඩුවේ කටයුතුවලට අවශ්‍ය නිලධාරීන් සපයා ගත හැකි වෙතැයි කෝල්බෲක් බලාපොරොත්තු විය.

## 5.2 ශ්‍රී ලාංකිකයන්ගේ උද්ඝෝෂණ

1833 වර්ෂයේ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමෙන් පසුව එම ආණ්ඩු ක්‍රමයේ යම් යම් වෙනස්කම් ඇති කර ගැනීම සඳහා උද්ඝෝෂණයක් මුල්වරට ආරම්භ කරන ලද්දේ මෙරට සිටි යුරෝපීයන් විසිනි. මෙකී යුරෝපීයන් වතු වගා කටයුතු සඳහා ලංකාවට පැමිණ උඩරට ප්‍රදේශවල වැවිලි කටයුතුවල නිරත වූ ධනවත්තු වෙති. ඔවුන්ගේ වතු පිහිටි ප්‍රදේශවලට මාර්ග පහසුකම් දියුණු කර ගැනීම, තැපැල් හා පණිවිඩ හුවමාරු පහසුකම් ඇති කර ගැනීම හා වතුකරයට අවශ්‍ය වෙනත් පහසුකම් දියුණු කිරීම වෙනුවෙන් ව්‍යවස්ථාදායකය මගින් මුදල් වෙන් කර ගැනීමේ අවශ්‍යතාවක් මේ වන විට මතුව තිබුණි. මෙම යුරෝපීය ප්‍රජාව නියෝජනය කිරීමට ව්‍යවස්ථාදායක සභාවට නිල නොලත් නියෝජිතයන් තිදෙනෙකු පත් කර සිටි බව මීට පෙර සඳහන් කෙරිණ. එහෙත් ව්‍යවස්ථාදායකයේ නිල නොලත් පිරිසට වඩා නිල ලත් නිලධාරීන් බහුතරයක් වීමත් එම සභාවට ලැබී තිබූ බලතල ප්‍රමාණවත් නොවීමත් නිසා ඔවුහු උද්ඝෝෂණ ආරම්භ කළහ. මෙම උද්ඝෝෂණ ගෙන යාමට 1865 වර්ෂයේ දී ඔවුන් විසින් ලංකා සංගමය නම් සංවිධානයක් පිහිටුවන ලදි. විලියම් ඩිග්බි, ජෝර්ජ් වෝල් වැනි අය එම උද්ඝෝෂණවල කැපී පෙනෙන නායකයෝ වූහ.

කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු මෙරට වතු වගාව දියුණු වීමත්, ආනයන අපනයන ආර්ථිකයක් බිහි වීමත් නිසා ලාංකිකයන්ට ද යම් යම් ව්‍යාපාර කටයුතුවල නිරත වීමෙන් මුදල් උපයා ගැනීමට අවස්ථාව ලැබුණි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී වැවිලි කටයුතු, තොග හා සිල්ලර වෙළෙඳාම, මිනිරන් කර්මාන්තය ආදී ව්‍යාපාර කටයුතුවල යෙදීමෙන් මුදල් උපයා ගත් ලාංකික පිරිසක් බිහි වූහ. එසේ බිහි වූ ලාංකික ධනවතුන් තම දූ දරුවන්ට මෙරට දී මෙන් ම විදේශ රටවලට යැවීමෙන් ද උසස් අධ්‍යාපනයක් ලබා දීම නිසා ඉංග්‍රීසි උගත් මධ්‍යම පාන්තික පිරිසක් බිහි වූහ. 20 වන සියවස ආරම්භයේ දී එම පිරිස ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණ කිරීමට පෙළඹිණ. එය ලාංකිකයන්ගේ දේශපාලන උද්ඝෝෂණවල ආරම්භය ලෙස සැලකේ.


උගත් ලාංකික මධ්‍යම පන්තිය අතරින් මුල් කාලයේ දී දේශපාලන උද්ඝෝෂණවලට නායකත්වය දුන් පිරිස අතර පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, සර් ජේම්ස් පීරිස්, එච්. ජේ. සී. පෙරෙයිරා වැනි අය විශේෂයෙන් කැපී පෙනේ. මෙසේ උගත් ලාංකිකයන්ගේ මැදිහත් වීමෙන් උද්ඝෝෂණ මෙහෙයවීමට මුල් කාලයේ පිහිටු වූ සංවිධාන අතර පහතරට නිෂ්පාදන සංගමය, හලාවත සංගමය, යාපන සංගමය කැපී පෙනෙන සංවිධාන කිහිපයකි.

උගත් ලාංකිකයන් අතරින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව පිළිබඳව දීර්ඝව කරුණු පැහැදිලි කරමින් 1908 වර්ෂයේ දී මුල්වරට විධිමත් සන්දේශයක් යටත් විජිත භාර ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලද්දේ සර් ජේම්ස් පීරිස් මහතා විසිනි. ඉන් අනතුරුව විවිධ සංවිධාන හා පුද්ගලයන් විසින් ද තවත් එබඳු පෙත්සම් රැසක් ද ඉදිරිපත් කරන ලදි. එම පෙත්සම් මගින් ලාංකිකයන් ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ යෝජනා කිහිපයක් මෙසේ ය.

- ❖ ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන් පිරිස වැඩි කිරීම
- ❖ ව්‍යවස්ථාදායක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයන් තේරීම
- ❖ වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

## 5.3 කෲව් - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1910

1910 වර්ෂය වන විට ලංකාවේ ආණ්ඩුකාරධුරය දැරූ හෙන්රි මැකලම් ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ පදනම් කොටගෙන යටත් විජිත භාර ලේකම් කෲව් සාමිවරයා විසින් 1910 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් මෙරටට ලබා දෙන ලදි. එය කෲව්-මැකලම් ආණ්ඩුක්‍රමය වශයෙන් හැඳින්වේ. මෙම ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩි කර තිබුණි. නිල ලත් පිරිස 11 දෙනෙකු වූ අතර 10 දෙනෙක් නිල නොලත් සාමාජිකයෝ වූහ. එකී නිල නොලත් සාමාජිකයන් 10 දෙනා වාර්ගික නියෝජන ක්‍රමයෙන් හය දෙනෙකු ද සීමිත ඡන්ද බලයෙන් හතර දෙනෙකු ද (යුරෝපීය දෙදෙනෙක් ද බර්ගර් එක් අයෙකු හා උගත් ලාංකිකයන් එක් අයෙකු) වශයෙන් පත් කෙරිණ.




ඉහත සටහන දෙස බලන විට ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් තෝරා ගැනීමේ දී ඡන්ද බලයෙන් නියෝජිතයන් තෝරා ගැනීමට ඉඩ ලැබීමත් උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයෙක් තෝරා ගැනීමට අවස්ථාව සලසා දී තිබීමත් මෙම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ වේ.

උගත් ලාංකිකයන් වෙනුවෙන් නියෝජිතයෙකු තෝරා පත් කර ගැනීම නිසා මෙරට මධ්‍යම පන්තියට ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කිරීමට ඉඩ ලැබුණි. මෙම ධුරය සඳහා මුල්වරට පත් වූයේ පොන්නම්බලම් රාමනාදන් මහතා ය.




**5.1 රූපය - පොන්නම්බලම් අරුණාචලම් මහතා**

## 5.4 ලංකා ජාතික සංගමය

කෲව් - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට පෙර ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී විවිධ සංවිධාන හා පුද්ගලයන් යටත් විජිත භාර ලේකම්වරයාට වෙන් වෙන්ව පෙත්සම් යැවූ ආකාරය ඉහත සඳහන් කෙරිණ. කුඩා කුඩා


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සංවිධාන වශයෙන් පෙත්සම් යැවීමෙන් යටත් විජිත පාලකයන්ට බලපෑම් කළ නොහැකි බවත් ලාංකිකයන් එකතු වී ශක්තිමත් හඬක් නැගීමට නම් සියලු දෙනාගේ සහයෝගය ලැබෙන පොදු සංවිධානයක් පිහිටුවිය යුතු බවත් මධ්‍යම පාන්තිකයෝ තේරුම් ගත්හ. ඉන්දියානුවන් ඉන්දියානු ජාතික සංගමය පිහිටුවා එක්සත්ව කටයුතු කළ ආකාරය මෙහි දී ලාංකික උගතුන්ට ද ආදර්ශයක් විය. 1919 වර්ෂයේ දී ලංකා ජාතික සංගමය පිහිටුවූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. එවකට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයෙකු වූ පොන්නම්බලම් අරුණාචලම් මහතා ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති තනතුරට පත් විය.




ලංකා ජාතික සංගමයට එක් වූ කුඩා සංවිධාන කිහිපයක් ඉහත දැක්වේ.

සිංහල, දෙමළ, මුස්ලිම් වැනි මෙරට වාර්ගික ජන කොටස් නියෝජනය කළ සංවිධාන රැසක් ලංකා ජාතික සංගමය වශයෙන් පොදු අරමුණක් වෙනුවෙන් එකට එකතු වීම මෙරට දේශපාලන ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් ලෙස පෙන්නුම් කළ හැකි ය.

ලාංකිකයන් අතට දේශපාලන බලතල ලබා ගැනීම සඳහා ශක්තිමත් උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීම ලංකා ජාතික සංගමයේ ප්‍රධාන අරමුණ විය. මේ අනුව ඉදිරි ප්‍රතිසංස්කරණවල දී ව්‍යවස්ථාදායක සභාවේ ලාංකික සාමාජිකයන් සංඛ්‍යාව වැඩි කර ගැනීම, එහි බලතල වැඩි කර ගැනීම, ඡන්ද බලයෙන් නියෝජිතයන් බහුතරයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා ගැනීම, දේශීය නායකයන්ට පාලන කටයුතුවලට වැඩි වැඩියෙන් සම්බන්ධ වීමට අවස්ථාව ලබා ගැනීම වැනි අරමුණු ඒ අතර කැපී පෙනුණි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත අරමුණු දිනා ගැනීම සඳහා ලංකා ජාතික සංගමය අනුගමනය කළ ක්‍රියා මාර්ග සටන්කාමී නොවූ අතර ඉතාමත් සාමකාමී ස්වරූපයක් පෙන්නුම් කළේ ය. ඒ අනුව බ්‍රිතාන්‍ය රජයට පෙත්සම් යැවීම, යටත් විජිත ලේකම්වරයාට පෙත්සම් යැවීම, රැස්වීම් පවත්වා ජනතාව දැනුම්වත් කිරීම, ව්‍යවස්ථාදායකය තුළ තර්ක ඉදිරිපත් කිරීම, ආණ්ඩුකාරවරයාගේ ප්‍රසාදය දිනා ගැනීමට ප්‍රයත්න දැරීම, පුවත්පත්වලට ලිපි ලියමින් ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව පැහැදිලි කරදීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කළේ ය.


## 5.5 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය -1920

1910 – ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් සෑහීමකට පත් නොවූ ලාංකිකයන් දිගින් දිගට ම උද්ඝෝෂණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1920 වර්ෂයේ දී තවත් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් මෙරටට ලැබුණි. එවකට ලංකා ආණ්ඩුකාරවරයා වූ විලියම් මැනිංගේ නිර්දේශය මත සකස් කෙරුණ මෙම ආණ්ඩුක්‍රමය මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ.

### ව්‍යවස්ථාදායක සභාව

මෙම ප්‍රතිසංස්කරණය මගින් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 37ක් දක්වා වැඩි කෙරිණ. ඔවුන්ගෙන් 14 දෙනෙකු නිල ලත් සාමාජිකයන් වූ අතර 23 දෙනෙක් නිල නොලත් සාමාජිකයෝ වූහ. නිල නොලත් සාමාජිකයන් 23 දෙනාගෙන් හතක් ආණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන්, (නම් කිරීමෙන්) පත් කරන ලදි. ඉතිරි 16 දෙනා ඡන්ද බලයෙන් පත් කිරීම මෙම ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයකි. 1920 වර්ෂයේ ව්‍යවස්ථාදායක සභාව පත් වූ ආකාරය පහත සටහනින් පෙන්නුම් කෙරේ.

### ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය - 1920




මෙම ආණ්ඩුක්‍රමය අනුව ව්‍යවස්ථාදායක සභාවේ නිල ලත් පිරිසට වඩා නිල නොලත් පිරිස වැඩි වූ බව බැලූ බැල්මට පෙනෙන නමුත් තීරණාත්මක ඡන්ද විමසීමක දී නිල ලත් දාහතර දෙනාට නාමකරණයෙන් පත් වූ හත් දෙනා ද එක් වන බැවින්, ඡන්දයෙන් පත් වූ දහසය දෙනාට වඩා වැඩි ඡන්දයක් ආණ්ඩුකාරවරයාට හිමිව තිබිණ.

## 5.6 1924 මැනිං - ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

1920 – ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ලාංකිකයන්ගේ අපේක්ෂා ඉටු නොවුණි. මේ නිසා ලංකා ජාතික සංගමය මෙම ප්‍රතිසංස්කරණයට විරුද්ධ විය. මෙම සංගමය 1920– ප්‍රතිසංස්කරණය යටතේ පැවැත්වෙන මැතිවරණය වර්ජනය කිරීමටත් සැරසුණි. මේ වන විට ඉන්දියාවේ ඉංග්‍රීසි පාලනයට එරෙහිව ප්‍රබල උද්ඝෝෂණයක් සිදු වෙමින් පැවතුණි. ලංකාවේ ද එබඳු තත්වයක් ඇති වෙතැයි ඉංග්‍රීසීහු බිය වූහ. එබැවින් 1920 – ප්‍රතිසංස්කරණය පිළිගෙන කටයුතු කරන්නේ නම් ඉතා කෙටිකලකින් නැවත ප්‍රතිසංස්කරණයක් ලබා දෙන බවට මැනිං ආණ්ඩුකාරවරයා ලංකා ජාතික සංගමයට පොරොන්දු විය. 1924 – වර්ෂයේ දී නැවත වරක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ලබා දීම සිදු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. විලියම් මැනිං ආණ්ඩුකාරවරයාගේ නිර්දේශය මත යටත් විජිත භාර ලේකම් ඩෙවොන්ෂයර් විසින් සකස් කරන ලද මෙම ප්‍රතිසංස්කරණය මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ.

මැනිං – ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 49 දක්වා වැඩි කෙරිණ. 12 දෙනෙකු නිල ලත් සාමාජිකයන් වූ අතර 37ක් නිල නොලත් සාමාජිකයෝ වූහ. නිල නොලත් සාමාජිකයන්ගෙන් 29 දෙනෙකු ඡන්ද බලයෙන් පත් කෙරුණ අතර අට දෙනෙකු ආණ්ඩුකාරවරයා නාමකරණයෙන් පත් කළේ ය. ඡන්ද බලයෙන් පත් කෙරුණ 29 දෙනාගෙන් 23 දෙනෙකු පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය යටතේ ද හය දෙනෙකු වාර්ගික නියෝජන ක්‍රමය යටතේ ද පත් කෙරිණ.

**මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය -1924**






නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ප්‍රතිසංස්කරණය යටතේ නිල ලත් සාමාජිකයන් 12 දෙනා හා නාමකරණයෙන් පත් කළ 8 දෙනා එකතු වුවත්, ඡන්දයෙන් පත් වූ 29 දෙනාට වඩා එය සුළුතරයක් විය. එබැවින් ව්‍යවස්ථාදායක සභාව තුළ ආණ්ඩුකාරවරයාට පක්ෂපාත බහුතර ඡන්දයක් නොවී ය. මේ නිසා ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ආණ්ඩුකාරවරයා අසීරු තත්වයකට පත් විය.

1920 - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් මෙන් ම 1924 - ප්‍රතිසංස්කරණය යටතේ ද ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තේරීමේ දී ඡන්ද දායකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් ගැන ලාංකිකයන් තුළ අප්‍රසාදයක් පැවතුණි. ඡන්ද දායකයෙකු වීමට කිසියම් භාෂාවක් ලිවීමට හෝ කියවීමට හැකි වීමත් දේපළ හෝ ආදායම් හිමිකාරිත්වයක් තිබීමත් අවශ්‍ය විය. එබැවින් මෙරට සිටි ඡන්ද දායකයන් සංඛ්‍යාව සීමා වී තිබුණි.

## 5.7 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය - 1931

මැනිං - ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ බහුතර ආසන සංඛ්‍යාවක් ලාංකිකයන්ට ලැබීම නිසා ආණ්ඩුකාරවරයාට උපායශීලීව කටයුතු කිරීමට සිදු විය. මෙම තත්වය මෙරට ආණ්ඩුකාරවරුන් විසින් යටත් විජිත භාර ලේකම්වරයාට දැනුම් දීම නිසා ලංකාවට පැමිණ තත්වය සොයා බලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට 1927 වර්ෂයේ දී ඩොනමෝර් කොමිසම් සභාව පත් කෙරිණ. ඩොනමෝර් සාමිවරයාගේ සභාපතිත්වයෙන් පත් වූ මෙම කොමිසම ලංකාවට පැමිණ ලාංකිකයන්ගේ සාක්ෂය ලබා ගෙන පුළුල් විමර්ශනයක් සිදු කොට තම නිර්දේශය ඉදිරිපත් කර ඇත. එම නිර්දේශය පදනම් කර ගත් ප්‍රතිසංස්කරණ 1931 සිට ක්‍රියාත්මක කෙරුණ අතර එය ඩොනමෝර් ආණ්ඩුක්‍රමය වශයෙන් හැඳින්වේ.

මීළඟට අපි ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා කිහිපයක් වෙන් වෙන්ව ගෙන සලකා බලමු.

### රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීම

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක සභාව රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්වී ය. එහි සාමාජිකයන් සංඛ්‍යාව 61කි. 50 දෙනෙකු ඡන්ද කොට්ඨාස අනුව මහජන ඡන්දයෙන් තෝරා ගත් අතර නියෝජනයක් නොලැබූ සුළු ජාතීන් වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ නාමකරණයෙන් අට දෙනෙකු පත් කෙරිණි. රාජ්‍ය නිලධාරීන් ලෙස හැඳින්වූ ඉතිරි තිදෙනා රාජ්‍ය ලේකම්, මුදල් ලේකම්, නීති ලේකම් වශයෙන් කටයුතු කළ අය වේ.

**ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාව**

61

- **පළාත්බද ඡන්ද කොට්ඨාසවලින්** 50
- **රාජ්‍ය නිලධාරින්** 03
  - **රාජ්‍ය ලේකම්**
  - **මුදල් ලේකම්**
  - **නීති ලේකම්**
- **ආණ්ඩුකාරවරයා නම් කළ** 08

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුලසුන හිමි වූයේ එහි සාමාජිකයන්ගේ ඡන්දයෙන් තෝරා ගත් කථානායකවරයාට ය. ඒ අනුව මෙහි ප්‍රථම කථානායක ධුරයට ඒ. එෆ්. මොලමුරේ මහතා පත් විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නිල කාලය අවුරුදු පහකි.

## සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම

1910 කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණයේ සිට ව්‍යවස්ථාදායක සභාවට මන්ත්‍රීන් තේරීමේ දී ඡන්ද බලය ක්‍රියාත්මක වුවත්, එය හිමි වූයේ ජනගහනයෙන් සීමිත පිරිසකට ය. ඡන්ද දායකයෙකු ලෙස සුදුසුකම් ලැබීමට කිසියම් ප්‍රමාණයක අධ්‍යාපන සුදුසුකමක් හා ධනයක් අවශ්‍ය විය. මේ නිසා සාමාන්‍ය ජනතාවට ඡන්ද බලය හිමි නොවූ අතර ඡන්ද දායක පිරිස ජනගහනයෙන් 4%ක් තරම් සුළු පිරිසකට සීමා විය. සාමාන්‍ය ජනතාව මේ ආකාරයෙන් දේශපාලන භූමියෙන් ඈත් කර තැබීම දේශපාලකයන්ගේ අවධානය ඔවුන් කෙරේ යොමු නොවීමට හේතු වී ඇතැයි ඩොනමෝර් කොමසාරිස්වරු පෙන්වා දුන්හ. එම නිසා සාමාන්‍ය ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගන්වා ඔවුන්ගේ ශුභසාධනය සඳහා දේශපාලනඥයන්ගේ අවධානය යොමු කරවීමට නම් සර්වජන ඡන්ද බලය ලබා දිය යුතු යයි කොමිසම නිර්දේශ කළේ ය. මේ අනුව වයස අවුරුදු 21ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට ම ඡන්ද බලය හිමි විය. මෙය පොදු ජනතාව ලද විශාල ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය. මේ ආකාරයට කිසි දු භේදයකින් තොරව බ්‍රිතාන්‍ය යටත් විජිත අතරින් ඡන්ද බලය හිමි කර ගත් ප්‍රථම ආසියාතික රට බවට ශ්‍රී ලංකාව පත් විය.

## විධායක කාරක සභා පිහිටුවීම

රාජ්‍ය මන්ත්‍රණ සභාව ව්‍යවස්ථාදායක හා විධායක කටයුතු කරන මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක විය. එයට පවරා දුන් ව්‍යවස්ථාදායක කටයුතු එම මණ්ඩලය සමස්තයක් ලෙස රැස්ව ක්‍රියාවට නැංවී ය. විධායක කටයුතු සඳහා රාජ්‍ය මන්ත්‍රණ සභාව කාරක සභා හතකට බෙදා තිබුණි. මේ අනුව මහ මැතිවරණයකින් පසුව රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් වන මන්ත්‍රීන් 61 දෙනාගෙන් කථානායකවරයා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැර ඉතිරි 57 දෙනා කාරක සභා හතකට බෙදිණි. එම කාරක සභා හත පහත සඳහන් වේ.

- ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව
- කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ කාරක සභාව
- පළාත් පාලනය පිළිබඳ කාරක සභාව
- සෞඛ්‍ය පිළිබඳ කාරක සභාව
- අධ්‍යාපනය පිළිබඳ කාරක සභාව
- කම්කරු කර්මාන්තය හා වෙළෙඳාම පිළිබඳ කාරක සභාව
- ගමනාගමනය හා පොදු වැඩ කටයුතු පිළිබඳ කාරක සභාව

සෑම කාරක සභාවක් ම වෙන් වෙන්ව රැස් වී ඒ ඒ කාරක සභාවේ සභාපතිවරයා පත් කර ගත යුතු විය. සභාපතිවරු ඒ ඒ විෂය ක්ෂේත්‍රය භාර අමාත්‍යවරුන් ලෙස පත් වූහ.

මෙම සභාපතිවරුන් හත් දෙනා මෙන් ම රාජ්‍ය නිලධාරීන් තිදෙනා ද ඇමතිවරුන් ලෙස සැලකිණ.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ විධායක කාරක සභා නිසා ලාංකික දේශපාලනඥයන්ට පාලනය පිළිබඳ පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව හිමි වූ අතර පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් කරා යන ගමනේ දී එය වැදගත් සන්ධිස්ථානයක් විය.

## ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනා

මෙතෙක් ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රමයන්ට සාපේක්ෂව ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයාගේ බලය බොහෝ දුරට අඩු කර තිබුණි. ආණ්ඩුවේ සියලු වගකීම් තවදුරටත් ආණ්ඩුකාරවරයාට පැවරීමට බලාපොරොත්තු නොවූ ඩොනමෝර් කොමසාරිස්වරු ඉන් කොටසක් ලාංකිකයන් වෙත පැවරීමට අපේක්ෂා කළහ. ඒ අනුව රාජ්‍ය මන්ත්‍රණ සභාව සම්මත කරන පනත්වලට අවසාන අනුමැතිය දීම, රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සම්බන්ධයෙන් බලපාන ක්‍රියා පිළිබඳ තීරණ ගැනීම ආදි බලතල ආණ්ඩුකාරවරයාට පැවරුණි.


මෙම ආණ්ඩුක්‍රමය යටතේ ආරක්ෂාව, මුදල් කටයුතු නීති වැනි වැදගත් අංශ පිළිවෙළින් රාජ්‍ය ලේකම්, මුදල් ලේකම්, නීති ලේකම් යන රාජ්‍ය නිලධාරින් තිදෙනා යටතේ පැවතිණ.

### වාර්ගික නියෝජනය අහෝසි කිරීම

ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරා ගැනීමේ දී 1833 වර්ෂයේ සිට බ්‍රිතාන්‍යයන් විසින් වාර්ගික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කරන ලදි. මෙය ලංකාවේ විවිධ ජනවර්ග අතර භේද ඇති වීමට තුඩු දුන් නියෝජන ක්‍රමයකි. මේ නිසා වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කළ යුතු යැයි 1931 වර්ෂය දක්වා ම ලාංකිකයෝ හඬ නැගූහ. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කොට ප්‍රාදේශීය නියෝජනය ශක්තිමත් කිරීම අගය කළ යුතු කරුණකි.

## 5.8 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය - 1947

### සෝල්බරි කොමිසම පත් කිරීම



5.2 රූපය - සෝල්බරි සාමි

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිටුවූ අමාත්‍යාංශ දහයෙන් හතක බලතල ලාංකිකයන්ට ලැබුණු නමුත් රාජ්‍ය නිලධාරීන් තිදෙනාට වැදගත් අමාත්‍යාංශ තුනක් පවරා දී තිබීමත්, ආණ්ඩුකාරවරයාට පවරා තිබූ බලතල ආදියත් ගැන මෙරට දේශපාලනඥයෝ සතුටු නොවූහ. මේ නිසා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක කළ කාලයේ ම එම ආණ්ඩුක්‍රමය සංශෝධනය කොට නව ආණ්ඩුක්‍රමයක් ලබා ගැනීමේ උද්ඝෝෂණයක් ඇරඹිණ. එම උද්ඝෝෂණවල මූලික අරමුණු කිහිපයක් මෙසේ ය.

- රාජ්‍ය නිලධාරීන්ට පවරා තිබූ අමාත්‍යාංශ ලාංකිකයන්ට ලබා ගැනීම
- ලාංකික අමාත්‍යවරුන්ට පවරා තිබූ බලතල පුළුල් කර ගැනීම
- විධායක කාරක සභා ක්‍රමය වෙනුවට කැබිනට් ක්‍රමයක් ලබා ගැනීම

මෙම උද්ඝෝෂණවල දී ඇමති මණ්ඩලයත්, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මහජන නියෝජිතවරුත් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළහ. ලංකා ජාතික සංගමය වැනි සංවිධාන ඇමති මණ්ඩලයට සහාය ලබා දුණි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

1939 වර්ෂයේ දී දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වීම නිසා ලෝක යුද්ධයේ දී බ්‍රිතාන්‍යයන්ට ලාංකිකයන්ගේ සහයෝගය අවශ්‍ය විය. ලෝක සංග්‍රාමයේ දී ජර්මනියට එරෙහිව සටන් වැදුණු රටවල් අතර බ්‍රිතාන්‍යය කැපී පෙනන සේවයක් ඉටු කළේ ය. මෙම දුෂ්කර අවස්ථාවේ දී ඇමති මණ්ඩලය මෙරට සහය බ්‍රිතාන්‍යයන්ට ලබාදීමට ඉදිරිපත් වූ අතර යුද්ධය නිම වීමෙන් පසුව ලාංකිකයන්ට වැඩි බලතල ලැබෙන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ලබා ගැනීම ඔවුන්ගේ අරමුණ විය. යුද්ධ සමයේ දී මෙරට ඇමතිවරුන්ට ද ආණ්ඩුකාරවරයා ඇතුළු බ්‍රිතාන්‍යය නිලධාරීන් සමග සමීපව, සහයෝගයෙන් කටයුතු කිරීමට අවස්ථාව ලැබුණි. මේ නිසා ලාංකිකයන්ගේ දේශපාලන ඉල්ලීම් පිළිබඳව බ්‍රිතාන්‍ය නිලධාරීන් තුළ ද නම්‍යශීලී ආකල්පයක් ඇති වූ බව පෙනේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පැහැදිලි කෙරෙන ප්‍රකාශයක් 1943 වර්ෂයේ මැයි මාසයේ දී මෙරට ආණ්ඩුකාරවරයා විසින් නිකුත් කරන ලදි. ඒ අනුව රටේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ වගකීම ලාංකිකයන්ට පැවරෙන ප්‍රතිසංස්කරණයක් ලබාදීමට බ්‍රිතාන්‍ය කටයුතු කරන බව ප්‍රකාශ විය. එම ප්‍රකාශයට අනුව සුදුසු ව්‍යවස්ථා කෙටුම්පතක් පිළියෙල කිරීමේ බලය ඇමති මණ්ඩලයට පැවරිණ. ව්‍යවස්ථා කෙටුම්පත පිළියෙල කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ විශේෂඥයෙකු වූ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ සහාය ලබා ගැනීමට ඇමතිවරු කටයුතු කළහ.

ඇමති මණ්ඩලයේ කෙටුම්පත 1944 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී සකස් කොට අවසන් විය. ඇමති මණ්ඩලයේ ව්‍යවස්ථා කෙටුම්පත පරීක්ෂා කොට මෙරට සුළු ජාතීන් ඇතුළු විවිධ කණ්ඩායම් සමඟ සාකච්ඡා කොට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 1944 වර්ෂයේ ජූලි මස බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් විශේෂ කොමිසන් සභාවක් පත් කරන ලදි. සෝල්බරි සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු එම කොමිසම සෝල්බරි කොමිසම ලෙස හැඳින්වේ.

1944 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී සෝල්බරි කොමිසම මෙරටට පැමිණ කරුණු සොයා බලා 1945 දී කොමිසමේ වාර්තාව නිකුත් කළේ ය. එම වාර්තාව පදනම් කරගෙන සැකසුණු ආණ්ඩුක්‍රමය 1947 වර්ෂයේ සිට මෙරට ක්‍රියාත්මක විය. එය සෝල්බරි ආණ්ඩුක්‍රමය ලෙස හැඳින්වේ.

සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ❖ ආණ්ඩුකාර ධුරය අහෝසි කොට ආග්‍රාණ්ඩුකාර ධුරයක් ස්ථාපිත කිරීම.
- ❖ ද්වීමණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටුවීම.
  (මහජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව)
- ❖ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම
- ❖ රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම

### අග්‍රාණ්ඩුකාරවරයා



5.3 රූපය - හෙන්රි මන්ක් මේසන් මුවර්

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ මෙතෙක් පැවති ආණ්ඩුකාරධුරය අහෝසි කෙරිණ. මෙම ආණ්ඩුක්‍රමය යටතේ ද බ්‍රිතාන්‍ය රැජින ලංකාවේ නායිකාව ලෙස පිළිගත් නිසා ඇය නියෝජනය කිරීමට අග්‍රාණ්ඩුකාර තනතුරක් හඳුන්වා දුන්නේ ය. බ්‍රිතාන්‍ය රැජින විසින් අග්‍රාණ්ඩුකාරවරයා පත් කරන ලදි. ඔහුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ අංශයන්හි බලතල රැසක් හිමි වුවත් අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා කටයුතු කළ යුතු වූ හෙයින් තනතුර නාමමාත්‍ර විධායක තනතුරක් බවට පත් විය. එවකට ආණ්ඩුකාර තනතුර දැරූ සර් හෙන්රි මන්ක් මේසන් මුවර් මෙරට ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා වශයෙන් ද කටයුතු කළේ ය.

### පාර්ලිමේන්තුව

සෝල්බරි ආණ්ඩුක්‍රමයට අනුව ව්‍යවස්ථාදායකය හෙවත් නීති සම්පාදනය කළ ආයතනය පාර්ලිමේන්තුව නමින් හඳුන්වනු ලැබී ය. පාර්ලිමේන්තුව මහජන මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය යන මණ්ඩල දෙකකින් සමන්විත වූ බැවින් එය ද්වීමාණ්ඩලික පාර්ලිමේන්තුවක් ලෙස හැඳින්වේ.



5.4 රූපය - පැරණි පාර්ලිමේන්තුව




නොමිලේ බෙදාහැරීම සඳහා ය.


මහජන මන්ත්‍රී මණ්ඩලය පාර්ලිමේන්තුවේ පළමුවන මණ්ඩලය වූ අතර එයට මන්ත්‍රීවරුන් 101 දෙනෙක් අයත් වූහ. එයින් 95ක් ඡන්ද කොට්ඨාස පදනම යටතේ මහජන ඡන්දයෙන් තෝරා ගන්නා ලදි. ඉතිරි හය දෙනා නියෝජනයක් නොලැබූ සුළු ජාතීන් වෙනුවෙන් අගමැතිගේ උපදෙස් පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදි. පාර්ලිමේන්තුවේ නිල කාලය වසර පහකි.

පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හෙවත් උත්තර මන්ත්‍රී මණ්ඩලය ලෙස හැඳින්විණ. මෙම මණ්ඩලය සාමාජිකයන් 30කින් යුක්ත විය. 15ක් අගමැතිගේ උපදෙස් පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදි. ඉතිරි 15 දෙනා පත් කර ගන්නා ලද්දේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ ඡන්දයෙනි. සෙනෙට් සභාවේ නිල කාලය වසර හයකි.

## අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය


5.5 රූපය - ප්‍රථම කැබිනට් මණ්ඩලය

සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ විධායක බලය හෙවත් නීති ක්‍රියාත්මක කිරීමේ බලය අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට හිමි විය. කැබිනට් මණ්ඩලයේ නායකත්වය අගමැතිවරයාට ලැබුණි. අග්‍රාණ්ඩුකාරවරයා විසින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතර විශ්වාසය දිනා ගත් පුද්ගලයා අගමැති තනතුරට පත් කරනු ලැබී ය. අගමැතිවරයාගේ නිර්දේශය පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් කැබිනට් මණ්ඩලය පත් කරන ලදි. මහජන මන්ත්‍රී මණ්ඩලයේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හා සෙනෙට් මණ්ඩලයේ මන්ත්‍රීවරුන් අතුරින් කැබිනට් මණ්ඩලය තෝරා ගැනුණි. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් දෙදෙනෙකු කැබිනට් මණ්ඩලයට පත් කළ යුතු බව හා ඉන් එක් අයෙකු අධිකරණ ඇමතිවරයා විය යුතු බව සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් විය. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ඉන් අපේක්ෂා කළේ ය. ආණ්ඩුව ගනු ලබන තීරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට සාමූහිකව ම වගකීම, කැබිනට් මණ්ඩලයේ ප්‍රධාන ලක්ෂණයක් විය.


5.6 රූපය - ඩී. එස්. සේනානායක මහතා

## රාජ්‍ය සේවා කොමිසම

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නීතිපති, විගණකාධිපති, ස්ථිර ලේකම් වැනි රජයේ ඉහළ නිලධාරීන් පත් කිරීම අගමැතිගේ උපදෙස් පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරන ලදි. ඊට අමතරව පහළ රාජ්‍ය සේවකයන් පත් කිරීම, ඉවත් කිරීම, විනයානුකූල පාලනය ආදිය සඳහා රාජ්‍ය සේවා කොමිසම් සභාවක් පත් කෙරිණ. රාජ්‍ය සේවා කොමිසම සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

## අධිකරණ සේවා කොමිසම

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රවිනිශ්චයකාරවරයා හා ඉහළ අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම අගමැතිගේ උපදෙස් පිට අග්‍රාණ්ඩුකාරවරයා විසින් සිදු කරන ලදි. අනෙක් පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් පත් කිරීම, ඉවත් කිරීම, විනයානුකූල පාලනය සඳහා අධිකරණ සේවා කොමිසම් සභාව පත් කර තිබුණි. මෙය අග්‍රවිනිශ්චයකාරවරයා හා තවත් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් යුක්ත විය.

### ක්‍රියාකාරකම



පහත සඳහන් කරුණු ඇසුරින් බ්‍රිතාන්‍යයන් යටතේ සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු ඇතුළත් පිටු පෙරළනයක් සකස් කරන්න.

1. බ්‍රිතාන්‍යයන් යටතේ සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
2. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට ඇතුළත් වැදගත් යෝජනා
3. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල යහපත් අයහපත් ලක්ෂණ